# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2472/17 - 2026 ජනවාරි මස 20 වැනි අඟහරුවාදා - 2026.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 203 වගන්තිය යටතේ කරන නියමයයි

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර හනීෆ් යූසුෆ් වන මම 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 203 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් නියමය සිදුකරන බව මෙයින් නිවේදනය කරමි.

**හනීෆ් යූසුෆ්,**
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

වර්ෂ 2026 ක් වූ ජනවාරි මස 20 දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**ඉහත කී නියමය**

1. මෙම නියමය බොරලැස්ගමුව නගර සභාවේ 2026 වර්ෂයට අදාළ අයවැය ලේඛනය සම්බන්ධයෙන් 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 178 (1) උපවගන්තිය හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත ඉහත කී නගර සභා ආඥාපනතේ 178 (අ) වගන්තියෙහි සඳහන් නීතිමය විධිවිධාන සම්පූර්ණ කිරීම සඳහා කාලය දීර්ඝ කිරීම බලාත්මක කිරීම පිණිස පනවනු ලබයි.


1A - PG 7483 — 04 (2026/01)



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 178 (1) උපවගන්තිය යටතේ හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත ඉහත කී නගර සභා ආඥාපනතේ 178 (අ) වගන්තිය යටතේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව බොරලැස්ගමුව නගර සභාව සඳහා 2026 වර්ෂයට අදාළ අයවැය ලේඛනය සම්බන්ධයෙන් වූ කාර්යපටිපාටිය අනුගමනය කිරීම සඳහා 2026.01.30 දින දක්වා කාලය දීර්ඝ කර දෙන ලෙස බොරලැස්ගමුව නගර සභාව විසින් 2026.01.20 දින තීරණය කර ඊට අදාළ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති හෙයින් ද,

3. ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස් මගින් කරුණු පරීක්ෂා කිරීමෙන් පසු බොරලැස්ගමුව නගර සභාවේ බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අයවැය ලේඛනය සම්බන්ධයෙන් නීතිමය කාර්යපටිපාටිය සම්පූර්ණ කිරීම පිණිස කාලය දීර්ඝ කිරීමේ මූලික අවශ්‍යතාවයක් පැනනැගී ඇති බවට කරුණු වාර්තා කර ඇති හෙයින් ද, 2026 වර්ෂයට අදාළ බොරලැස්ගමුව නගර සභාවේ අයවැය ලේඛනය සම්බන්ධයෙන් ඉහත සඳහන් වගන්ති යටතේ වූ කාර්යපටිපාටිය සම්පූර්ණ කිරීම සඳහා 2026 ජනවාරි මස 30 දින දක්වා කාලය දීර්ඝ කරන බවට මෙයින් නියම කරමි.

EOG 01-0215

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.